

# සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් කරා...

## දෑ අවුරුදු අභියෝග සමයේදී සෞභාග්‍යයේ දැක්මට විවර කළ මං පෙත් සටහන්...

# ජාතික ආරක්ෂාවට මුල් තැන :

- බුද්ධි සේවා ප්‍රතිසංවිධානය හා එම සේවා අතර මනා සම්බන්ධීකරණයක්, අවශ්‍ය පුහුණුව, තාක්ෂණය, පහසුකම් සමගින් බුද්ධි සේවා සඳහා නෛතික රාමුවක් ස්ථාපිත කිරීමට ජාතික බුද්ධි පනත් කෙටුම්පතක්.

- මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම මගින් පාතාලය හා මත්ද්‍රව්‍ය ජාවාරමට තිත.

- ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ හා දිවි පිදූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයන් සඳහා අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් ගෙවන ලද වැටුප් හා දීමනා දිවි පිදූ සාමාජිකයාගේ යැපෙන්නන් සහ ආබාධිත සාමාජිකයන් හට ඔවුන් ජීවත්ව සිටින තාක්.

- ජාතික ආරක්ෂාව පිලිබඳ ලොව ඇති ඉහළම මට්ටමේ පාඨමාලාව හැදෑරීමේ අවස්ථාව දේශීය නිලධාරින්ට විවෘත කිරීමට ජාතික ආරක්ෂක විද්‍යාතනයක්.

- පොලිසියේ කාර්ය මණ්ඩලය 100,000 ක් දක්වා වැඩි කිරීම යටතේ නව බඳවා ගැනීම් 10,000 ක්.

සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය
1-



# ජාතික ආරක්ෂාවට මුල් තැන :

- බුද්ධි සේවා ප්‍රතිසංවිධානය හා එම සේවා අතර මනා සම්බන්ධීකරණයක්, අවශ්‍ය පුහුණුව, තාක්ෂණය, පහසුකම් සමගින් බුද්ධි සේවා සඳහා නෛතික රාමුවක් ස්ථාපිත කිරීමට ජාතික බුද්ධි පනත් කෙටුම්පතක්.

- මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම මගින් පාතාලය හා මත්ද්‍රව්‍ය ජාවාරමට තිත.

- ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ හා දිවි පිදූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයන් සඳහා අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් ගෙවන ලද වැටුප් හා දිමනා දිවි පිදූ සාමාජිකයාගේ යැපෙන්නන් සහ ආබාධිත සාමාජිකයන් හට ඔවුන් ජීවත්ව සිටින තාක්.

- ජාතික ආරක්ෂාව පිලිබඳ ලොව ඇති ඉහළම මට්ටමේ පාඨමාලාව හැදෑරීමේ අවස්ථාව දේශීය නිලධාරීන්ට විවෘත කිරීමට ජාතික ආරක්ෂක විද්‍යාතනයක්.

- පොලිසියේ කාර්ය මණ්ඩලය 100,000 ක් දක්වා වැඩි කිරීම යටතේ නව බඳවා ගැනීම් 10,000 ක්.

සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...

ජනාධිපති කාර්යාලය
1. පුස්තකාලය




| | |
|---|---|
| පරි. අංක | 6754 |
| වර්ග අංකය | 320.6 |
| දිනය | |


# මිත්‍රශීලී සහ නොබැඳුනු විදේශ ප්‍රතිපත්තියක් :

- කලාපීය සහ ලෝක බලවතුන් හමුවේ රැකගත් මිත්‍රශීලී සහ නොබැඳි රාජ්‍ය ප්‍රතිපත්තියක්.
- ථේරවාද බුදු දහමේ අභිවෘද්ධිය වෙනුවෙන් ආසියානු කලාපයේ බෞද්ධ විහාරස්ථාන හා ලංකාවේ විහාරස්ථාන සම්බන්ධ කර කලාපීය සහයෝගීතාවයෙන් "සසුනට උදාව" වැඩසටහන.
- ශ්‍රී ලංකාව අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ඕස්ට්‍රේලියානු සහ චීන අධ්‍යාපන ආයතන සමග ශක්තිමත් සම්බන්ධතා.
- ආර්ථික රාජ තාන්ත්‍රික කටයුතු මගින් නව ආයෝජන ආකර්ෂණය.


ජනාධිපති ලේකම් කාර්යාලය
30 NOV 2021
පුස්තකාලය


සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...



# පිරිසිදු රාජ්‍ය පාලනයක් :

- සැමට පරමාදර්ශයක් වෙමින් ජනාධිපතිතුමා විසින් සිය පරිවාර රථ සංඛ්‍යාව අඩු කිරීම, නිල නිවස ලෙස තමා පදිංචි නිවස තෝරා ගැනීම සහ ජනාධිපති කාර්ය මණ්ඩලය අත්‍යවශ්‍ය ප්‍රමාණයට සීමා කිරීම.

- මහජනයාගේ පහසුව උදෙසා ලිහිල් කිරීමට කටයුතු කරන නීති රීතීන් සහ ආයතන අතර රජයේ ඉඩම් නීතිය, ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත, ආගමන විගමන දෙපාර්තමේන්තුව, රේගුව ඇතුළු නීති රීතීන් සහ ආයතන රාශියක්.

- බලය තිබියදී ගමට නොයන දේශපාලන චර්යාව වෙනස් කරමින් ජනතා ගැටළු සෘජුවම හඳුනාගැනීමට ගමින් ගම චාරිකා කිරීමේ "ගම සමග පිළිසඳර" වැඩසටහන.

- රජයේ වියදම් කළමනාකරණ ප්‍රතිපත්තියට සමගාමීව, නව රජයේ වාහන සහ ගොඩනැගිලි අවශ්‍යතාවය අමතර වියදම් රහිතව පවතින සම්පත් තුළින්ම.

- විදේශ රාජ්‍ය නායක සමුළු සඳහා ජනාධිපතිතුමන් සහභාගී වීමේ දී අත්‍යවශ්‍ය නිලධාරීන්ගෙන් පමණක් සමන්විත අවම දූත පිරිසක් හා ජනාධිපති ආර්යාව ගේ වියදම් සිය පෞද්ගලික වියදමින්.

සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...



## ජනතාවට වගකියන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් :

- ජනතාවගේ පරමාධිපත්‍ය බලය ප්‍රමුඛත්වයේ තබා ක්‍රියාත්මක කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා විද්වත් කමිටුවක්.

- නව ව්‍යවස්ථාව සෑදීම සඳහා මහජනතාව, සිවිල් සංවිධාන, ආගමික නායකයින්, දේශපාලන පක්ෂ ඇතුළු පුළුල් පරාසයක අදහස් සහ යෝජනා.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ ඇති වාර්තා සහ නව සංශෝධනය ගෙන ඒමට පෙර සිදු කරන ලද ප්‍රයත්නයන් ද ඇතුළුව ගැඹුරු අධ්‍යයනයක්.

- ඒ අනුව සකසන ලද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත අවසන් අදියරේ.

සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...



## ඵලදායි පුරවැසියෙක් - සශ්‍රීක මානව සම්පතක් :

- කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ලොව වැඩිම වේගයකින් දෛනික එන්නත්කරණය පවත්වාගෙන යාම යටතේ 2021 ඔක්තෝබර් මස අවසානය වන විට එන්නත්කරණය සඳහා වයස සම්පූර්ණ කළ මුළු ජනගහනයෙන් 82% ක් වෙත පූර්ණ එන්නත්කරණය සහ 95.8% ක් වෙත අර්ධ එන්නත්කරණය.

- විශ්වවිද්‍යාල වලට ඇතුළත් කරගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 10,000 කින් ඉහළට.

- ආබාධිත පුද්ගලයන් සඳහා පාසල් සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ඇති දුෂ්කරතා ඉවතට.

- උපාධිධාරීන් 60,000 කට ආසන්න පිරිසකට සහ අඩු ආදායම් ලාභීන් 100,000 කට රැකියා ලබා දීම යටතේ උපාධිධාරීන් 58,145 දෙනකු හා අඩු ආදායම් ලාභීන් 39,053 දෙනකු 2021 ඔක්තොම්බර් මස අවසන් වන විට සේවයට.

- මෙරටට අවශ්‍ය ඖෂධ අවශ්‍යතාවයෙන් 50% ක් දේශීයව නිෂ්පාදනය ආරම්භ කිරීම හා විදෙස් වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින් ඖෂධ නිෂ්පාදනය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔයාමඩුව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරුබොක්ක හා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ මිල්ලෑව යන ප්‍රදේශයන්හි නව දේශීය ඖෂධ නිෂ්පාදන කලාප.


සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...



## ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් :

- වතු කම්කරුවන් හට රුපියල් දහසක දෛනික වැටුපක්.
- ජනතාව භුක්ති විඳිමින් සිටින ගැටළු නැති ඉඩම් සඳහා නිරවුල් ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙල යටතේ නිරවුල් ඔප්පු 72,265 ක්.
- හරිත ශ්‍රී ලංකාවක් කරා යන ගමනේ වස විසෙන් තොර ආහාර වේලක අයිතිය තහවුරු කිරීම වස් වී ගොවිතැන සඳහා මුළු රටටම ප්‍රමාණවත් කාබනික දියර පොහොර හා ජෛව දියර පොහොර නිෂ්පාදනයක්.
- කොවිඩ් වසංගතයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාරික ප්‍රජාව යළි නගා සිටුවීමට ණය සහන පමා කාලයක් (debt moratorium) හා ණය වාරික සහන පැකේජයක්.
- රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් විශ්‍රාමික, ජ්‍යෙෂ්ඨ පුරවැසි සහ ළමා ඉතිරි කිරීමේ ගිණුම්.

සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...



# තාක්ෂණය මත පදනම් වන සමාජයක් :

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ පාර්ශවයන් සමග සම්බන්ධ වෙමින් දූෂණ හා අක්‍රමිකතා තුරන් කිරීමට අවශ්‍ය ඩිජිටල් යෙදවුම් පදනම ලෙස ජෛවමිතික දත්ත මත පදනම් වූ ශ්‍රී ලංකා ඩිජිටල් හැඳුනුම්පතක් (SLUDI).

- ගාල්ල, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වල තාක්ෂණ උද්‍යාන 5 ක්.

- ජාතික ඩිජිටල් සංවර්ධන ක්‍රියාවලිය යටතේ පාසල් 10,155 ක්, ග්‍රාම නිලධාරී වසම් 14,022 ක්, විශේෂිත ප්‍රජාව සහ අධ්‍යාපන ආයතන ආවරණය කරමින් අධිවේගී ෆයිබර් ඔප්ටික්ස් (5G) සම්බන්ධතා.

- රජය විසින් සපයනු ලබන සේවාවන් වඩා විධිමත්ව පරිශීලක හිතකාමී අයුරින් තනි ස්ථානයකින් (Single Window) සේවා ලාභියාට සැපයීම පිණිස පළාත් පාලන ආයතන 27ක ක්‍රියාත්මක form.gov.lk ව්‍යාපෘතිය.

සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...




## භෞතික සම්පත් සංවර්ධනය :

- පිට පළාත්වල සිට කොළඹට පැමිණෙන මගීන් සඳහා පහසුවෙන් සහ ඉක්මනින් ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට කොට්ටාව මාකුඹුර ප්‍රදේශයෙන් ආරම්භ කරන ලද Park & Ride පහසුකම.

- ප්‍රධාන මාර්ග, අධිවේගී මාර්ග හා අතුරු මාර්ග වලට තදබදයෙන් තොර ව ඇතුළු විය හැකි වන පරිදි සංවර්ධනය කර නිම කළ මාර්ග කිලෝ මීටර් 1,500 ක් ජනතා අයිතියට.

- මෙගා වොට් 25 ක ධාරිතාවයකින් යුත් බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය මෙම වසරේ නොවැම්බර් 30 වන විට ජාතික විදුලි බල පද්ධතිය සතුවට.

- වසර 05 ක් තුළ නිවාස වලට පිරිසිදු පානීය ජලය ලබා දීමේ අරමුණින් 'සැමට ජලය' ව්‍යාපෘති 169 ක්.

සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...



# තිරසාර පරිසර කළමනාකරණය :

- වසර 2030 වන විට රටේ සමස්ත විදුලිය අවශ්‍යතාවයෙන් 70% ක් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර මගින් උත්පාදනය කිරීමේ අරමුණ කරා යන ගමනේදී 'සූර්ය බල සංග්‍රාමය' වැඩසටහන මගින් ජාතික විදුලි බල පද්ධතියට මෙගා වොට් 429.22 ක් සහ මන්නාරම සුළං බල උද්‍යානය (තම්බපවණි) මගින් මෙගා වොට් 100 ක්.

- ශ්‍රී ලංකාවේ වන වැස්ම වැඩි කිරීම සඳහා 'හුස්ම දෙන තුරු' වැඩසටහන යටතේ මුළු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක රුක් රෝපණ වැඩසටහන්.

- එක් වරක් භාවිතා කරන ප්ලාස්ටික් තහනම යටතේ ප්ලාස්ටික්, පානීය බට, බීම කෝප්ප ඇතුළු තෝරාගත් ප්ලාස්ටික් භාණ්ඩ වර්ග කිහිපයක් භාවිතය තහනමට.

- මැණික් ගඟ සුරක්ෂණය කිරීමෙන් ආරම්භ කර රට තුළ ඇති ගංගා 103 ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක 'සුරකිමු ගංගා' ජාතික වැඩසටහන.

සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...



## විනය ගරුක, නීතිගරුක සහ ගුණගරුක සමාජයක් :

- නීතිය පසිඳලීම, ක්‍රියාත්මක කිරීම සහ නීතියේ රැකවරණය යන දෑ සර්ව සාධාරණ සහ සුරක්ෂිත කිරීම සඳහා ද, ජාතිය, ආගම, කුලය හෝ වෙනත් සාධකයක් මත කිසිදු පුරවැසියෙකු නීතියේ වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවිය යුතු බව තහවුරු කිරීම සඳහා ද, එක් රටක් එක් නීතියක් සංකල්පය ක්‍රියාත්මක කිරීමට ජනාධිපති කාර්ය සාධක බලකායක්.

- මහජන හිතෛෂී පොලිස් සේවයක් මගින් අපරාධ තව දුරටත් මර්දනය කර සාමකාමී දේශයක් ගොඩ නැගීම වෙනුවෙන් දිවයිනේ අත්‍යවශ්‍ය ප්‍රදේශයන්හි නව පොලිස් ස්ථාන 78 ක්.

- ධර්ම දූත සේවාව වෙනුවෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ත්‍රිපිටක ධර්මය ඉගැන්වෙන පිරිවෙන් සංඛ්‍යාව ඉහළට.

- ආගමික ස්ථාන වල භෞතික සංවර්ධන සහ ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා "පුණ්‍ය ග්‍රාම" වැඩසටහන.

සෞභාග්‍යයේ දැක්ම
යථාර්ථයක් කරා...

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය





ජනාධිපති කාර්යාලය
2021

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

© R&SA